ලියන ලද්දේ ICTA
2014 අප්‍රේල් 25 වෙනි සිකුරාදා, 07:50 -



කෞතුකාගාර පරිශ්‍රයේදී විශේෂ වැඩ සටහනක්...................... මතු පරපුර වෙනුවෙන් ජාතික සමගිය තහවුරු කරමින් සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් සියලුම රාජ්‍ය සේවකයන් තුළ ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 2014 වසරේ වැඩ කරන පළමු දිනය වන 2014 ජනවාරි මස 1 වන බදාදා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ සහභාගිත්වයෙන් එදින පෙ. ව. 9.00 ට කෞතුකාගාර පරිශ්‍රයේදී විශේෂ වැඩ සටහනක් පැවැත්විනි. එහිදී ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ සනුජා කස්තුරිආරච්චි මහත්මිය විසින් ජාතික ධජය එසවීමෙන් අනතුරුව සියල්ලෝම ජාතික ගීය ගායනා කරන ලදි. ඉන්පසුව රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු දෙනා සැමරීම සඳහා විනාඩි 02 ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කළ අතර පසුව දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල සාමාජිකයන් රාජ්‍ය සේවා ප්‍රතිඥාව හඬ නගා කියවන ලදි. අවසාන අංගය ලෙස ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂතුමිය කෙටි දේශනයක් පවත්වා කෞතුකාගාර භූමියේ පැළයක් ද රෝපනය කිරීමෙන් වැඩ සටහන අවසන් කරන ලදි. {besps}/News/2014/January{/besps}